**බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.10.27

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.
05. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමි මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**සහභාගීනොවුවෝ:-**

01. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

2010 වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාළ මහා සභා රැස්වීම අද දින පැවැත්වෙන අතර , රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සංවිධානය කර ඇති වැඩ මුළුවකට සහභාගීවන ලෙස දැනුම් දී ඇති නිසා ඊට සහභගාගි විය යුතු වන බැවින් සභා රැස්වීම අප දින පැවැත්වීමට කටයුතු කල බව දැන්වීය. එම හේතුව නිසා ගරු මන්ත්‍රීතුමන්ලා අපහසුතාවකට ලක්වූයේ නම් පළමුව ඒ සම්බන්ධව සමාද අයැදින බව දැන්වීය.

සබරගමුව පළාත් සභාවේ 2011 වර්ෂය සඳහා අයවැය වැයෙහි පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශිර්ෂය සාකච්ඡා එළිදැක්වීම අද දින පෙ.ව.10.00 ට සිදුකරන ලබන බැවින් , ඒ සඳහා සහභාගීවන ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමන් විසින් දැණුම් දුන් බැවින් තව

නොබෝ වේලාවකින් ඒ සදහා සහභාගීවීමට තමා මෙම සභා රැස්වීමෙන් ඉවත්ව යන යන නිසා , සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට

ගරු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාව මත ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු පත්කරගෙන සභාව පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

ගම නැගුම අධ්‍යක්ෂ්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකට තමන් සහභාගි වූ අතර එහිදී ගම නැගුම වැඩ සටහන යටතේ මෙම සභාව විසින් ඉටුකල සංවර්ධන කාර්යයන් ඉතා සාර්ථකව නිමකර ඇති බැවින් , ඒ සම්බන්ධව මෙම නගර සභාවට ප්‍රශංසාව පළකල බැව් දැන්වීය. ඒ සම්බන්ධව අපට සතුටුවිය හැකි බව පැවසීය.

ඉදිරියේ දී සියළුම මාර්ග ඉන්ටර්ලොකින් ගල්යොදා කොන්ක්‍රීට් කිරීමට රජය අදහස් කර ඇති බවත් , පෞද්ගලික සමාගම් හරහා ඉන්ටර්ලොකින් ගල් නිෂ්පාදනය නොකර ග්‍රාමීය මට්ටමින් එම ගල් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ද අදහස් කර ඇති බව දැනගැනීමට ලැබුණු බව සදහන් කරන ලදී.

මේ වන විට ගම නැගුම විශේෂ ව්‍යාපෘති යටතේ මිලියන 10 ක මුදලක් බළන්ගොඩ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය වෙත වෙන් වී ඇති බැව් දැන්වීය. එම ව්‍යාපෘතිය යටතේ මෙම නගර සභාවට මාර්ග සංවර්ධනය සදහා ලක්ෂ 30 ක මුදලක් සහ සුළු වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ලක්ෂ 17.5 ක මුදලක් වෙන්ව ඇති බැව් පැවසීය. එම ව්‍යාපෘතිය යටතේ වෙන් වී ඇති මුදල් උපයෝගී කරගෙන සංවර්ධන කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වන බව දැන්වීය. එම සියළු මුදල් ද ඇතුළත්ව මෙම සභාවට කෝටියකට ආසන්න මුදලක් ලැබී ඇති අතර , එම මුදල් වලින් ඉටුකල සංවර්ධන වැඩ සියල්ල අතිගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය නිමිතිකරගෙන නොවැම්බර් මස 19 වන දින උත්සවාකාරයෙන් ජනතා අයිතියට පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැන්වීය. ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ මුදල් වෙන් වු ව්‍යාපෘතියන්හි වැඩ කටයුතු සියල්ල නොවැම්බර් මස 31 දිනට පෙර අවසන් කල යුතුව තිබෙන බැව් සදහන් කරන ලදී.

2011 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත සකස් කර ඇති අතර එය රජයේ නිලධාරීන් , රාජ්‍ය ආයතන, ස්වේච්ජා සංවිධාන හා පුරවැසි කමිටුව හරහා ලබාගන්නා ලද යෝජනා පෙළගස්වමින් සකස් කර ඇති බව දැන්වීය. ජනතාවට වඩාත් යහපත් සේවාවක් සැලසීම එමගින් අපේක්ෂා කරන බව පැවසු අතර , එම කෙටුම්පත අධ්‍යයනය කර ඊට ඇතුළත්විය යුතු නව යෝජනා හා කල යුතු වු සංශෝධනයන් සම්බන්ධව දිර්ඝව සාකච්ඡාව කිරීම අවශ්‍ය වන බැවින් ඒ සදහා විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම සුදුසු යැයි පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

2011 වර්ෂයේ අයවැය සම්බන්ධව සාකච්ඡා කිරීමට 2010.11.10 වන විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව එකමතිකව සභා සම්මත විය.

❖ සබරගමුව පළාත් සභාවේ අයවැය ඉදිරිපත් කිරීමේ අවස්ථාවට අද දින ගරු සභාපතිතුමන්ට සහභාගීවීමට සිදුව ඇති නිසා නිසා අත්‍යාවශ්‍ය සහ හදිසි ලිපිලේඛන පමණක් සභා අනුමැතියට ඉදිරිපත්කර, ඉතිරි ලිපිලේඛන සියල්ල 2010.11.10 වන දින පැවැත්වීමට නියමිත විශේෂ මහා සභා රැස්වීමට යොමු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

03) **2010.09.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2010.09.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

(05) **සභාවට ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම**

05:01 **ණය සීමාවන් පැනවීම හා සුළු මුදල් අග්‍රිමය සංශෝධනය කිරීම**

බළන්ගොඩ තානායමේ ක්‍රියාකාරීත්වය හා එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් පැවති පුහුණු වැඩ මුළුවේ දී සාකච්ඡා කරගත් පරිදි භාණ්ඩ ණයට ගැණුම් හා විකුණුම් විධිමත් පාලනයකට ලක්කිරීමට හා අභ්‍යන්තර පාලනයක් ඇතිකිරීම සඳහා , සුළු මුදල් අග්‍රිම සීමාව සංශෝධනය කිරීමට පහත යෝජනා ඉදිරිපත් කරන බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. තානායම් කළමනාකරුට රු.25,000/- දක්වා භාණ්ඩ ණයට ගැනීමට හා විකිණීමටත්, ඒ වෙනුවෙන් ඔහුගෙන් රු.25,000/- ක ඇප සුරක්ෂණයක් ලබාගැනීම.

02. රු.25,000/- කට වඩා වැඩි ණයට ගැණුම් හා විකුණුම් සඳහා ලේකම්තුමාගේ හා සභාපතිතුමාගේ අනුමැතිය ලබාගත යුතුවීම.

03. සුළු මුදල් අග්‍රිමය රු.20,000/- දක්වා වැඩිකිරීමට හා අයිතමයක් සඳහා වැයකල හැකි උපරිම මුදල රු.5,000/- දක්වා වැඩිකිරීම.

ඉහත සඳහන් සංශෝධනයන් හා සීමාවන් තුළ කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **බේරුම්කරණ මධ්‍යස්ථාන නඩුව සම්බන්ධවයි**

ඉහත අංක දරණ නඩුව 2010.11.22 වන දිනට කල්තබන ලද අතර , 2010.10.18 වන දිනට අදාළ වෘත්තිමය ගාස්තු වශයෙන් රු.30,000/- ක මුදලක් ගෙවන ලෙස ඉල්ලමින් ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ චන්ද්‍රානී දයාරත්න මහත්මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාළ මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

ද

05:03 ජාතික සවිය - ගම නැගුම විශේෂ සංවර්ධන වැඩ සටහන - 2010

ඉහත සඳහන් කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම් බළන්ගොඩ විසින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් අමතමින් මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව යොමු කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

උක්ත වැඩ සටහන යටතේ බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්නා ලද පහත සඳහන් ව්‍යාපෘති යෝජනා 2010.10.15 වන දින පවත්වන ලද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී අනුමත වූ බැවින් , ඉදිරියේ දී මේ සඳහා ඇස්තමේන්තු සකස් කර එවන බව එමගින් දන්වා තිබිණ.

- රු.මිලියන 10 ක ප්‍රතිපාදන සඳහා විශේෂ සංවර්ධන යෝජනා
- රු.මිලියන 05 ක ප්‍රතිපාදන සඳහා සුළු වාරිමාර්ග ව්‍යාපෘති යෝජනා

| අංකය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘති යෝජනාව | ආයතනික දායකත්වය රු. | බලප්‍රදේශය නගර සභා |
|---|---|---|---|---|
| 01 | දෙහිගස්තලාව | බළන්ගොඩ ජාතික පාසල වටරවුම් පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම | 500000.00 | |
| 02 | බළන්ගොඩ | වැකුඹුර කනත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500000.00 | |
| 03 | තුඹගොඩ | සුදර්ශනගම ඉහළ කොටස පැති බැම්ම ඉදිකර මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500000.00 | |
| 04 | කිරිඳිගල | කිරිඳිගල ජනපද පාර අවසන් කොටස සංවර්ධනය කිරීම | 500000.00 | |
| 05 | තුඹගොඩ | ආනන්ද මෛත්‍රී මාවතේ ජලය නොමැති අයට ජල සම්පත් මණ්ඩලය හරහා ජලය ලබාදීම | 500000.00 | |
| 06 | ඇල්ලෙපොල | උඩ ඇල්ලෙපොල වැවේගෙදර පාර සංවර්ධනය කිරීම | 500000.00 | |
| 07 | තලංගම | ඇල්ලෙපොල සිට කිරිමැට්ටිතැන්න දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500000.00 | |

රු.මිලියන 05 ක ප්‍රතිපාදන සඳහා ලැබී ඇති සුළු වාරිමාර්ග ව්‍යාපෘති යෝජනා

| අංකය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘති යෝජනාව | ආයතනික දායකත්වය රු. | බලප්‍රදේශය නගර සභා |
|---|---|---|---|---|
| 01 | තුඹගොඩ | කිවුලෙවෙල බුබුල ප්‍රතිසංස්කරණය කිරීම | 150000.00 | |
| 02 | බළන්ගොඩ | වැකුඹුර ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 250000.00 | |
| 03 | දෙහිගස්තලාව | බළන්ගොඩ කල්තොට මාර්ගයේ එකේ කණුව අසළ දයාවංශ මහතාගේ නිවස අසළ සිට ජෙමිල් මහතාගේ නිවස දක්වා දිවෙන ඇල වේලි මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරීම | 250000.00 | |
| 04 | තුඹගොඩ | රණවිනාවත්ත වාරි මාර්ග ඇල සකස් | 250000.00 | |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම | | |
| 05 | බළන්ගොඩ | චන්න මහතාගේ නිවස පිටුපස ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 250000.00 | |
| 06 | කිරිඳිගල | අම්බලන් ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 250000.00 | |
| 07 | තලංගම | බුළුගහයට ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 500000.00 | |

**05:04 වැසිජල කාණු පද්ධතිය සකස් කරගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , තුඹගොඩ 5/11 දරණ ලිපිනයේ පදිංචි ධනපාල විජේමුණි මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

කිරිඳිගල මැද පාරේ බුද්ධ ජයන්ති විදුහලෙන් හා පාරෙන් එන වැසි ජලය බැසයාමට කාණු පද්ධතිය සකස් කර ඇත්තේ තමාගේ පුද්ගලික ඉඩමෙන් වන අතර , මෙම කාණුවට අවට නිවෙස් වල අපවිත්‍ර ජලය නිරන්තරව ගලාඒම නිසා නිවැසියන් මහත් පීඩාවකට ලක්ව ඇති බැවින් , මේ සම්බන්ධව සලකා බලා විධිමත් පරිදි කාණු පද්ධතියක් සකස් කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

**06. ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම**
**06:01 56-1906 කෘෂ කැබ් රථය අළුත්වැඩියා කිරීම**

මෙම නගර සභාව සතු ඉහත අංක දරණ කෘෂ කැබ් රථයේ එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා බළන්ගොඩ ඩිපෝ ඉංජිනේරුගේ නිර්දේශය අනුව මිළ ගණන් කැඳවන ලදී. එම මිළ ගණන් පහත දැක්වේ.

| කාරණය | නැෂනල් මෝටර්වේස් | සුරේඛා මෝටර්ස් | ලක්මිණී මෝටර්ස් | තෙබුවන ගරාජය | උදය කුමාර මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 1.එන්ජිම අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් සඳහා | 60267/- | 63000/- | 62400/- | 61795/- | 62500 |
| 2. වැඩ කුළිය | 28100/- | 28900/- | 29275/- | 30475/- | 29450/- |

ඉහත මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති නැෂනල් මෝටර්වේස්ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**06:02 බළන්ගොඩ නගර සභාවේ ගිනි නිවන රථය සඳහා ජල බවුසරයක් මිළදී ගැනීම :**

මෙම නගර සභාව සතු තිබෙන අංක SGZA-0228 දරණ ගිනි නිවීමේ රථය සඳහා ජල බවුසරයක් මිළදී ගැනීමට සභාපතිතුමා විසින් කැඳවන ලද මිළ ගණන් 04 ක් සභාව වෙත ඉදිරිපත කරන ලදී.

| | Make | Sub Make | Model | Year | Options | Amount |
|---|---|---|---|---|---|---|
| SSH Automobile & Investment Co pvt Ltd | ISUZU | - | PB-NKS81N | 2005 | - | Rs. 4,600,000.00 |
| SSH Automobile & Investment Co pvt Ltd | ISUZU | - | PB-NKR81AN | 2005 | FULL OPTIONS | Rs.3,000,000.00 |
| General Motor Agencies pvt Ltd | ISUZU | Atlas | ELF | 2002 | AC Power Steering Manual Gear P/Shutters 1-A/Bag ABS Double Wheel | Rs.2,900,000.00 |
| General Motor Agencies pvt Ltd | Nissan | Atlas | AHR 69 C | 2003 | AC Power Steering Manual Gear P/Shutters 1-A/Bag ABS Singer Wheel | Rs.2,160,000.00 |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති General Motor Agencies pvt Ltd වෙතින් Rs.2,160,000.00 ක මුදලකට ජල බවුසරය මිළදී ගැනීම සුදුසු බැව් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සභා සම්මත වූ අතර , මේ සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ අනුමැතිය ලබාගැනීමට තීරණය විය.

06:03 පාසල් සම්පත් කේන්ද්‍ර සඳහා බිම් තරාදි මිළදී ගැනීම:

| | ඩබ්.එම්.ඉන්ටර්නැෂනල් පු.ලි. | කසුන් එන්ටර්ප්‍රයිසස් පු.ලි | මාස් ඉන්ටර්නැෂනල් |
|---|---|---|---|
| 30 බිම් තරාදි 01 | 28000/- | 36000/- | 38000/- |
| 60 බිම් තරාදි | 45500/- | 55000/- | 53000/- |
| 150 බිම් තරාදි | 52000/- | 68000/- | 56000/- |

අවම මිළ ඉදිරිපත් කර ඇති ඩබ්.එම්.ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**07. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)**

2010.09.21 දින සිට 2010.10.26 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.09.21 | බී.ගුණරත්න<br>2010.09.01 සිට 2010.19.15 දින දක්වා නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම | 133 | 198031 | 100583.33 |
| | තාවකාලික වැටුප්<br>කර්මාන්ත අංශයේ තාවකාලික කම්කරුවන් සඳහා වැටුප් ගෙවීම | 135 | 198038 | 64500.00 |
| 2010.09.23 | කේ.ජී.සුදත් සමන් කුමාර<br>තානායම් මැද මිදුල ගල් අතුරා සකස් කිරීම කර්මාන්තයේ වැඩ කුළිය කොටසක් ගෙවීම | 138 | 198039 | 137000.75 |
| 2010.09.27 | රෝයල් සෙරමික් ලංකා ලිමිටඩ්<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය පිගන් ගඩොල් ලබාගැනීම | 139 | 201164 | 43468.46 |
| 2010.09.27 | එස්.ඩී.සී.සී.ස්ටීල් මර්චන්ට්<br>තානායම අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාගැනීම<br>ජී.අයි බට 1" 1450x2 2900.00<br>ජී.අයි.බට 1 1/2" 2500x3 7500.00<br>හැස්කෝතල 110x1 110.00 | 140 | 201165 | 10510.00 |
| | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන්<br>ලීටර් 180 තාර බැරල් 20 ලබාගැනීම සඳහා | 141 | 201166 | 336780.00 |
| | වැලිගම ඉලෙක්ට්‍රො සිටි<br>තානායම සඳහා අවශ්‍ය 30 ලී මයික්‍රෝ වේව් අවන් එකක් ලබාගැනීම | 143 | 201168 | 22473.00 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 144 | 201169 | 35750.00 |
| | ජී.ඩබ්.ඉන්ද්‍රලාල්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 06 ලබාගැනීම | 145 | 201170 | 24000.00 |
| 2010.09.27 | රිෂානා සර්විස් ස්ටේෂන්<br>226-7521 ටිපර් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 149 | 201174 | 10193.00 |
| | ඩැක්ස් ඉංජිනියරින්<br>බොබ් කැට් යන්ත්‍රයේ කම්බයන් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 152 | 201176 | 40539.38 |
| | නිව් වෙල්කම් එන්ටප්‍රයිසස්<br>පණිවුඩකරුට පාපැදියක් මිළදී ගැනීම | 153 | 201177 | 12950.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 අගෝස්තු මාසයේ දුරකථන බිල පියවීම<br>2287275/2287153/2286596/2288737<br>E- Mail | 154 | 201178 | 19041.51 |
| 2010.09.27 | එම්.ඩී.ගුණසේන සහ සමාගම<br>පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීම පොත් 57 සඳහා | 158 | 201182 | 24149.50 |
| | 2010 ඔක්තෝබර් මාසය | | | |
| 2010.10.05 | කේ.ජී.ගෙන්ගාදරන්<br>කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා හිස් ඉටි බෑග් ලබාගැනීම | 01 | 201193 | 20200.00 |

| | | | | |
|---|---|---|---|---|
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ තානායම් ගොඩනැගිල්ල සහිත මාර්ගයේ කෙළවර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 04 | 201196 | 24820.60 |
| | බී.ගුණරත්න<br>2010.09.16 දින සිට 2010.09.30 දින දක්වා නගරයේ කැලි කසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම | 05 | 201197 | 100583.33 |
| 2010.10.05 | අජිත් මෝටර්ස්<br>එච්.එෆ්.7899 ජේ.සී.බී.යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 07 | 201199 | 15600.00 |
| 2010.10.06 | ස.තො.ස.මෝටර්ස් පී.එල්.සී<br>56-1906 කෲ කැබ් රථය අලුත්වැඩියාවට අමතර කොටස් මිළදී ගැනීම | 09 | 204101 | 13755.17 |
| | යු.ඇන්ඩ් එච්.වීල් සර්විස්<br>එන්.ඩී.5124 වෑන් රථයට ටයර් 04 මිළදී ගැනීම | 10 | 204102 | 72070.36 |
| | ලංකා පොස්පේට් ලිමිටඩ්<br>බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පොස්පේට් ලබාගැනීම | 12 | 204104 | 53200.00 |
| 2010.10.06 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මස විදුලි බිල පියවීම<br>පොදු වෙළඳසැල/ප්‍රේක්ෂකාගාරය | 16 | 204105 | 11361.00 |
| 2010.10.08 | ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>ආර්.වී.8543 ට්‍රේලරය කසල ඉවත් කිරීමට හැකිවන සේ සකස් කිරීම තීන්ත ආලේප කිරීම , අකුරු ඇඳීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 20 | 204117 | 40900.00 |
| | ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>එච්.එෆ්.8558 ට්‍රැක්ටරයට හා එහි ට්‍රේලරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 21 | 204117 | 19875.00 |
| 2010.10.13 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොහොර හලන මැෂිම සඳහා සපයා ඇති එකලා විදුලිය තෙකලා විදුලි සේවාව කිරීම සඳහා අදාල ගාස්තු ගෙවීම | 32 | 204120 | 26270.00 |
| 2010.10.13 | එම්.ජී.පියසේන<br>2010.09.13 වන දින සිට 2010.10.07 දක්වා පෞද්ගලික බස්ගාල් ගාස්තු වලින් කොමිස් මුදල් 15% ආපසු ගෙවීම | 33 | 204121 | 19500.00 |
| | කළමණාකරු, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>මහජනපොළ වැසිකිළි පද්ධතිය මාළුකඩ , මුරකුටිය ඉදිකිරීමේ ලංසු කැඳවීම් පුවත්පත් නිවේදනය. 2010.08.06 දින දිනමිණ පත්‍රයේ පළකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 35 | 204122 | 21840.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2287023/3452939/2287022/2287024/3452932/3452931/2288400 | 36 | 204123 | 27690.67 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 37 | 204124 | 35500.00 |
| 2010.10.13 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.09.07 සිට 2010.09.23 දක්වා<br>වර්ගය ඒකක මිළ ප්‍රමාණය වටිනාකම<br>ඩීසල් 73.20 747 54680.40<br>එන්.<br>ඔයිල් 292 03 876.00<br>පැට්‍රල් 115.20 24 2764.80 | 38 | 204125 | 58321.20 |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.09.10 සිට 2010.09.17 දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>93.20</td><td>993</td><td>72687.60</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>292.00</td><td>01</td><td>292.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>44</td><td>5068.80</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>10</td><td>512.00</td></tr>
<tr><td>ටූ-ටී. 1/2</td><td>130.00</td><td>01</td><td>130.00</td></tr>
<tr><td>ඩී.එස්.කැන් 20 ලී</td><td>6460</td><td>02</td><td>12920.00</td></tr>
</table></td><td>39</td><td>204125</td><td>91610.40</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.08.08 සිට 2010.09.01 දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>553</td><td>40479.60</td></tr>
</table></td><td>40</td><td>204126</td><td>40479.60</td></tr>
<tr><td>2010.10.13</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.08.20 - 2010.08.31 දින දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>793</td><td>58047.60</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>292.00</td><td>1 1/2</td><td>438.00</td></tr>
<tr><td>ග්‍රීස් 250 g</td><td>190.00</td><td>01</td><td>190.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>44</td><td>5068.80</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>05</td><td>256.00</td></tr>
<tr><td>ටූ-ටී 1/2</td><td>130.00</td><td>01</td><td>130.00</td></tr>
</table></td><td>41</td><td>204126</td><td>64130.40</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.09.01 සිට 2010.09.11 දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>541</td><td>39601.02</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>292.00</td><td>02</td><td>584.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>34</td><td>3916.80</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>15</td><td>768.00</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>180.00</td><td>01</td><td>180.00</td></tr>
<tr><td>ඩී.එස්.කැන් 5 ලී</td><td>1615.00</td><td>01</td><td>1615.00</td></tr>
</table></td><td>42</td><td>204126</td><td>46665.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මස විදුලිබිල<br>කාර්යාලය/යාබද ගොඩනැගිල්ල</td><td>45</td><td>204127</td><td>16314.00</td></tr>
<tr><td></td><td>රෙජිස්ට්‍රාර්<br>2009 ජනවාරි සිට 2009 දෙසැම්බර් දක්වා උසාවි දඩ සකස් කිරීමේ දී කාර්ය මණ්ඩල 4% දීමනාව ගෙවීම</td><td>48</td><td>204130</td><td>14888.20</td></tr>
<tr><td>2010.10.13</td><td>එල්.ඒ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් කියුබ් 29.66 සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>49</td><td>204131</td><td>78118.00</td></tr>
<tr><td></td><td>ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>50</td><td>204132</td><td>19949.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2010 I වන කාර්තුවට අදාළ මුද්දර බදු ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම</td><td>52</td><td>204134</td><td>16025.00</td></tr>
<tr><td></td><td>දිලුමිණි බිල්ඩර්ස්</td><td>54</td><td>204136</td><td>42400.00</td></tr>
</table>

<table>
<tr><td></td><td>තානායම සදහා අවශ්‍ය කොන්ක්‍රීට් කණු හා සිමෙන්ති ගල් ලබාගැනීම</td><td></td><td></td><td></td></tr>
<tr><td>2010.10.13</td><td>හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම ජල ටැංකිය නව ආයුර්වේද ගොඩනැගිල්ල තීන්න ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>55</td><td>204137</td><td>19984.16</td></tr>
<tr><td></td><td>හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම අලුත්වැඩියාව හා ආයුර්වේද ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ද්‍රව්‍ය ලබාගැනීම</td><td>56</td><td>204137</td><td>18512.20</td></tr>
<tr><td></td><td>ෆයිරූස් හාඩ්වෙයාර්<br>කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීම සඳහා බෑග් ලබාගැනීම</td><td>58</td><td>204140</td><td>69700.00</td></tr>
<tr><td>2010.10.18</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.09.02 සිට 2010.09.07 දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>618</td><td>45237.60</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>292.00</td><td>1 1/2</td><td>438.00</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>375.00</td><td>1</td><td>375.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>40</td><td>4608.00</td></tr>
<tr><td>ඩී.එස්.කෑන්</td><td>1615.00</td><td>3</td><td>4845.00</td></tr>
</table></td><td>71</td><td>204153</td><td>55503.60</td></tr>
<tr><td>2010.10.18</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.07.02 සිට 2010.07.31 දක්වා
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>365</td><td>26718.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>06</td><td>691.20</td></tr>
</table></td><td>72</td><td>204153</td><td>27409.20</td></tr>
<tr><td></td><td>දේශානි හාඩ්වෙයාර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය උපාංග ලබාගැනීම</td><td>73</td><td>204154</td><td>11761.00</td></tr>
<tr><td></td><td>ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට 2010 සැප්තැම්බර් මාසයේ පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>74</td><td>204155</td><td>15650.00</td></tr>
<tr><td></td><td>ටී.ඒ.ටී.එච්.තෙබුවන<br>කොන්ක්‍රීට් මිශ්‍රණය අළුත්වැඩියාව වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>75</td><td>204156</td><td>15714.50</td></tr>
<tr><td>2010.10.18</td><td>ජගත් එන්ටප්‍රයිසස්<br>කාර්යාලය නවීකරණය සඳහා අවශ්‍ය විදුලි උපාංග ලබාගැනීම</td><td>77</td><td>204157</td><td>27090.00</td></tr>
<tr><td></td><td>ජෙම්සිටි ට්‍රේඩර්ස්<br>වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම<br>විදුණැන පියස 02 3000.00<br>ගණකාධිකාරීතුමාගේ කාමරය 1000.00<br>සභාපතිතුමාගේ/ලේකම්තුමාගේ/<br>පරිගණක අංශය/රැස්වීම් ශාලාව/<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක කාමරය 7500.00</td><td>78</td><td>204158</td><td>11500.00</td></tr>
<tr><td></td><td>හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ද්‍රව්‍ය ලබාගැනීම</td><td>79</td><td>204159</td><td>37940.82</td></tr>
<tr><td>2010.10.19</td><td>සභාපති, තලංගම පැරකුම් ගොවි සංවිධානය<br>ඇල්ලෙපොල සරස්වතීවත්ත පාර අංක 30 නිවස අසල පඩිපෙළ ඉදිකිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ගෙවීම</td><td>80</td><td>204160</td><td>12762.00</td></tr>
<tr><td>2010.10.19</td><td>එල්.බී.ඩබ්.ද සිල්වා<br>බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ ලබාගැනීම<br>තේක්ක පුටු 36 සඳහා 126000.00<br>3x3 කුඹුක් මේස 09 54000.00</td><td>85</td><td>204165</td><td>180000.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 2010.10.21 | බී.ගුණරත්න<br>2010.10.01 සිට 2010.10.15 දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් යෙදවීම | 86 | 204166 | 100583.33 |
| | සභාපති, කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මැද කිරිඳිගල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකිවන අයුරින් කොන්ක්‍රීට් කණු බෝක්කු ඉදිකිරීම ( ii අදියර ) අවසන් ගෙවීම | 88 | 204173 | 289260.57 |
| 2010.10.25 | කළමණාකරු, ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මාසයේ පොදු වෙළඳසැලේ ජල බිල පියවීම | 89 | 204198 | 29080.80 |
| 2010.10.25 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>වර්ගය / ඒකක මිළ / ප්‍රමාණය / වටිනාකම<br>ඩීසල් / 73.20 / 638 / 46701.60<br>පැට්‍රල් / 115.20 / 27 / 3110.40<br>ටූ-ටී 1/2 / 180.00 / 01 / 180.00 | 90 | 204199 | 49992.00 |
| | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බළන්ගොඩ තානායමේ මැද මිදුල සඳහා වහල ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 91 | 204200 | 177680.00 |
| | හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ද්‍රව්‍ය ලබාගැනීම | 92 | 204201 | 71935.92 |
| 2010.10.25 | එල්.ඊ.සී.සි.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබාගැනීම<br>වර්ගය / ඒකක මිළ / ප්‍රමාණය / වටිනාකම<br>3/4 / 4800.00 / 03 / 14400.00<br>4x4 / 4000.00 / 03 / 12000.00<br>1/2 / 3300.00 / 04 / 13200.00 | 100 | 204206 | 39600.00 |
| | ලංකා බැංකුව , බළන්ගොඩ<br>ලංකා බැංකුවේ අංකඃ 0005947-660 ගිණුමෙන් මහජන බැංකුවේ අංකඃ 017-100-10-6351750 දරණ ගිණුමට ලබාගත් අත්තිකාරම් මුදල් වලින් කොටසක් ආපසු ගෙවීම | 113 | 204216 | 3000000.00 |
| **2010.10.06 සිට 2010.10.26 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් ලංකා බැංකුව** | | | | |
| 2010.10.06 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>නව බස්නැවතුම්පලේ හිඟ විදුලි බිල පියවීම | 01 | 000064 | 11436.87 |
| | කළමණාකරු , ජල සම්පාදන මණ්ඩලය<br>බළන්ගොඩ මහජනපොළ සඳහා ජල සම්බන්ධතාවය ලබාගැනීම | 02 | 000065 | 43464.00 |
| 2010.10.13 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>නව බස්නැවතුම්පල විදුලි බිල පියවීම | 03 | 000066 | 58579.20 |
| **2010 සැප්තැම්බර් මාසය** | | | | |
| | සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන්<br>බළන්ගොඩ මහජනපොළ භූමියේ ගොඩ ගසා ඇති කසල ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගෙවීම | 04 | 000067 | 48990.00 |
| 2010.10.18 | ඩබ්.දයාරත්න<br>පොල සඳහා පවතින නඩුවේ බේරුම්කරණ ගාස්තු ගෙවීම | 05 | 000068 | 30000.00 |
| | කළමණාකරු ජාතික ජල සම්පාදන මණ්ඩලය | 07 | 000070 | 57260.00 |

| | | | | |
|---|---|---|---|---|
| | බළන්ගොඩ නව බස්නැවතුම්පලේ ජල බිල පියවීම | | | |
| 2010.10.25 | කොඩිකාර කන්ස්ට්‍රක්ෂන්<br>මහජනපොළ වැසිකිළි පද්ධතිය මාළු කඩ හා මුරකුටිය ඉදිකිරීම කර්මාන්තය සඳහා ලංසු ඇප තැන්පත් ආපසු ගෙවීම | 08 | 000071 | 40000.00 |
| 2010.09.28 සිට 2010.10.26 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් | | | | |
| 2010.09.28 | එස්.එම්.අසේන මරික්කාර්<br>තානායම සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 37 | 199084 | 59487.90 |
| 2010.09.30 | විනෝරා ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සදහා අවශ්‍ය සෝඩා සහ පැණිබීම ලබාගැනීම | 38 | 199085 | 10044.72 |
| | ලයන් බිලුවරි ( සිලෝන් ) පී.එල්.සී.<br>රටබීම මිළදී ගැනීම | 39 | 199086 | 26982.00 |
| | ටී.එච්.සුමතිපාල<br>තානායම සඳහා අවශ්‍ය කුකුළු මස් ලබාගැනීම | 40 | 199087 | 15692.25 |
| 2010.09.30 | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම සදහා අවශ්‍ය කුළු බඩු ලබාගැනීම | 43 | 199088 | 40946.00 |
| | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සදහා අවශ්‍ය මාළු ලබාගැනීම | 51 | 199092 | 25820.00 |
| | පී.ආර්.එස්.පී.ජයරත්න<br>තානායම සදහා අවශ්‍ය පාන් සහ කේක් ලබාගැනීම | 59 | 199094 | 11177.00 |
| 2010 ඔක්තෝබර් මාසය | | | | |
| 2010.10.06 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්<br>තානායමේ පොල් අතු මඩුව ඉදිකිරීම කර්මාන්තය අවශ්‍ය පොල් පරාල පොල් යට ලී පොල් අතු | 02 | 199099 | 83730.00 |
| | එම්.ඒ.එම්.හනීෆා<br>තානායම සදහා හාල් ලබාගැනීම | 13 | 203310 | 11051.00 |
| 2010.10.06 | ලංකා ප්ලවරින් ට්‍රේඩන් කම්පැණි<br>තානායම සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 25 | 17105 | 17105.00 |
| | ජී.වික්‍රම් සජිත තාරක කුරේ<br>කුකුළු මස් ලබාගැනීම | 27 | 203319 | 24120.00 |
| | ඒ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා රටබීම ලබාගැනීම | 28 | 203320 | 15876.00 |
| 2010.10.08 | යූ.ශාන්ත අබේසේකර<br>තානායම සදහා එළවළු ලබාගැනීම | 34 | 203324 | 20000.00 |
| | ඩිස්ටලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා<br>තානායම සදහා අවශ්‍ය රටබීම මිළදී ගැනීම | 37 | 203327 | 100729.92 |
| 2010.10.13 | ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මාසයේ විදුලි බිල පියවීම<br>තානායම/තානායම් නිල නිවස | 39 | 203328 | 13992.98 |
| | රොක්ලන්ඩ් ඩිස්ටලරීස් පුද්.සමාගම<br>තානායම සදහා අවශ්‍ය රටබීම මිළදී ගැනීම | 40 | 203329 | 25956.74 |
| | ඒ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සදහා අවශ්‍ය බියර් ලබාගැනීම | 41 | 203330 | 18696.00 |
| 2010.10.14 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා<br>තානායම සදහා රටබීම ලබාගැනීම | 43 | 203332 | 66186.96 |
| 2010.10.20 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා<br>තානායම සදහා අවශ්‍ය රටබීම මිළඳි ගැනීම | 48 | 203336 | 66294.00 |
| 2010.10.25 | කළමණාකරු, ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මාසයේ තානායමේ ජල බිල පියවීම | 50 | 203338 | 17152.80 |
| | ඩී.ආර්.ඉන්ඩස්ට්‍රිස්<br>බළන්ගොඩ තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 47 | 203335 | 144657.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

08. **ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

පහත සඳහන් ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| 01. | දේගපිටිය පාලමට සම්බන්ධ බැම්ම දිගුකිරීම කර්මාන්තය | 63853.32 |
| 02. | මැදකිරිඳිගල ධනපාල මහතාගේ නිවස අසල කාණුව ඉදිකිරීම | 28898.20 |
| 03. | තානායම මිදුල කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 399526.60 |

ඉහත ඇස්තමේන්තු අනුමත කළ සභාව , අංකඃ 03 යටතේ සඳහන් කර්මාන්තය කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් , එම සමිතිය වෙත කොන්ත්‍රාත් ලබාදී ඉටුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**09. යෝජනා ඃ-**
**ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ඃ**

01. U.C.ට්‍රැවල්ස් සංචාරක ප්‍රවාහන සේවයක් ඇතිකිරීම
02. ඉන්ටර්ලොකින් කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය කිරීමේ වැඩපළක් ආරම්භ කිරීම
03. සභාවේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති ලබාගැනීමට නිෂ්පාදන ආයතනයක් තෝරා ගැනීම
04. 2010.12.18 වන දින මහජනපොළ ජනතා අයිතියට පැවරීම සම්බන්ධව අදහස් විමසීම.
05. නගර සභා නිල නිවාස වල ආර්ථික කුළිය තක්සේරු කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනා සභා සම්මත විය. එසේ වුවත් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් මෙම යෝජනා සියල්ල පසුව සාකච්ඡා කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

**10. කාරක සභා වාර්තා සලකා බැලීම**

2010.10.13වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව සභාගත කරන ලදි.

එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

2010.08.01 දින සිට 2010.08.31 දක්වාත් 2010.09.01 සිට 2010.09.30 දක්වාත් මෙම නගර සභාවේ වාහන සඳහා වැය වී ඇති ඉන්ධන පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම ඉන්ධන වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

2010.10.22 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා බළන්ගොඩ තානායමෙහි වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම ගිණුම අනුව රු.271,410.89 ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කර ඇති බැවින් , අලාභයන් වලක්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකල යුතු බැව් ලේකම් මහතා විසින් සභාව වෙත පෙන්වා දෙන ලදී. පසුගිය සභාවේ දී මේ කෙරෙහි සභාවේ අවධානය යොමුකරවීමට කටයුතු කල නමුත් ඒ කෙරෙහි කිසිදු සැලකිලීමත්ව කටයුතු කර නොමැති බැව්

පෙනී යන බවත් , දිගින් දිගටම මෙම අසතුටුදායක තත්ත්වය පැවතුණහොත් සභාව විශාල විගණන විමසුමකට ලක්විය හැකි බැව් පෙන්වා දෙන ලදී.

එබැවින් මේ කෙරෙහි ගරු සභාපතිතුමාගේ වැඩි අවධානයක් යොමුකර අඩුපාඩු වලක්වා ගැනීම සඳහා අවශ්‍ය සියළු පියවර ගත යුතු බව විශේෂයෙන් අවධාරණය කරන බව වැඩිදුරටත් දැන්වීය.

මෙම ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

11. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2010 වර්ෂයේ සැප්තැම්බර් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5,058,330.30 |
| වෙනත් ලැබීම් | 2,393,823.87 |
| **මුළු ලැබීම්** | **7,452,154,17** |
| පුනරාවර්ථන වියදම් | 3,852,882.99 |
| වෙනත් වියදම් | 5,350,416.88 |
| **මුළු වියදම්** | **9,203,299.87** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12 **අවසානය:**
**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.